යෞවනියක ලෙසින් වයස අවුරුදු 18 දී යුධ හමුදා කාන්තා බලකායේ සේවයට බැඳී අප මව්බිම වෙනුවෙන් කරන ලද උදාර හා එඩිතර සේවය තවත් වසර 15ක් හෝ 20කින් අවසන් කරන සෙබළිය විශ්‍රාමයට මුහුණ දෙන්නේ ඉතාමත් අවිනිශ්චිත ආකාරයෙනි.

විශ්‍රාම ගැන්වෙන වයස අවුරුදු 33ක් හෝ 38ක් වනවිට සෙබළිය පිවිසෙන්නේ නුපුරුදු සිවිල් සමාජයකටය. සාමාන්‍ය පුද්ගලයෙකුට තිබෙන අවුරුදු 55 දක්වා රැකියාව කිරීමේ හැකියාව සෙබළියකට නැතිවීම මහත් අවාසනාවකි. තවත් අවුරුදු 17ක් පමණ රැකියාවක් කිරීමට තරම් වෙනත් වෘත්තීමය පුහුණුවක්, දැනුමක් හා අත්දැකීමක් ඇය තුළ නැත.

# "සෙබළිය"

## .....ඔබ හමු වේ !

හමුදා සේවා කාලය තුළ සෙබළිය විනය ගරුක, මව් රට වෙනුවෙන් ජීවිතය කැප කළ සමාජයට ආදර්ශයක් ලෙස නිරතුරුවම ක්‍රියා කරන්නියක වූවාය.

සෙබළිය මුලින්ම සේවා ගත වූයේ ශ්‍රී ලංකා යුධ හමුදාවේ සටන් පෙරමුණේදී තුවාල ලත් හෝ ආබාධිත හා රෝගාතුරවූ රණ විරුවන්ට සාත්තු සප්පායම් කිරීම සඳහාය. ඒ හෙදියක් හැටියටය.

පසු කලෙකදී ඇයට යුධ බිමට අවතීරනය වෙන්නට පවා සිදුවිය. යුධ බිමේදී මිය ගිය සෙබළියන් මෙන්ම ආබාධිතත්වයට පත් වූ සෙබළියන්ද ගණනින් වැඩි වෙන්නට පටන් ගැනුනි.

මේ තත්වය හමුවේ සෙබළියකට නැතිවූ රක්ෂිත අනාගතය නැවත ඇය වෙත ලබා දීමට කටයුතු කළ එක්තරා කාන්තාවක් විය. ඇය නමින් රමණී කාංගරආරච්චිය. ඇයද හමුදා කාන්තා බලකායේ සේවය කොට මේජර් තනතුරට පත් වූ නිලධාරිනියක් වූවාය.

සෙබළිය මුහුණ දෙන ප්‍රශ්ණ පිළිබඳව මනා අවබෝධයක් මේජර් රමණිට තිබුණි.

තවද ශ්‍රී ලංකා යුධ හමුදා කාන්තා බලකායේ විශ්‍රාම ගත් ප්‍රථම සෙබළියද ඇය විය.

ලුතිනන් ජනරාල් ජේ. ඊ. ඩෙනිස් පෙරේරා මහතාගේ උපදෙස් මත මේජර් රමණී කාංගරආරච්චි විසින් 1995 වසරේදී -ශ්‍රී ලංකා හමුදා කාන්තා බලකාය" නමින් සංගමයක් ආරම්භ කළාය.

එසේ පිහිටුවා ගත් සංගමය මගින් සෙබළිය මුහුණ පෑ අභියෝග රැසක් ජය ගන්නට විශ්‍රාමික කාන්තා සෙබළියන් දරන්නේ ඉමහත් වෙහෙසකි.

ෆ්‍රැන්සිස් කුරුකුලසූරිය

උපන් මව් බිම හා දැය වෙනුවෙන් ජීවිතය කැප-කොට ඔබ අප සැමගේ ජීවිත හා දේපලද පොදු සම්පත් ආදියද ආරක්‍ෂා කරන සෙබළ සෙබළියන්ගේ එම උදාර හා ගෞරවාන්විත සේවය පිළිබඳ අප කෘතඥවිය යුතුය.

කාන්තා සෙබළ බලකායේ සේවයේ යෙදී සිටි ලාංස් කෝප්‍රල් රූපවතී තම ජීවිතය පූජා කළේ ත්‍රස්තවාදී ප්‍රහාරයකදීය. එය සිදුවූයේ 1996 යේ අගෝස්තු මස 9 වන දින කීරමලේ බංකරයකදීය. රූපවතී හමුදා කාන්තා බලකාය තුළ මිය ගිය පළමු සෙබළිය විය.

ඇගේ අවමඟුල වෙනුවෙන් ලියැවුන කවි පෙළක්

30 වන පිටට

පිළිම නෙලා නැති
සැමරුම් දින නැති
විරුවන් පිරිසක්
සැතපෙන බව
පස් කඳු යට රහසේ
මිහිකත කම්පාවී
ගුගුරා දෙස් දේවී ....



සෙබළිය
Woman soldier
You live only once .................. to see
Musical variety concert
Presented by Pilisarana
udaya govinna
Mar 9
2.30pm - 6.30pm
The Besen Centre
87-89 Station street
Burwood
Melway 61C5
Contact
Francis Kurukulasuriya
0409224867



සුරක්ෂිත දෑතකට බාරදෙන්න
ඔබ ශ්‍රී ලංකාවට යවන සෑම ශතයකම
නියම වටිනාකම අපි ඔබට දෙන්නෙමු
Kapruka Pty Ltd
A.C.N. 088 958 105



ඔබ කප්රුක මගින් ශ්‍රී ලංකාවට මුදල් යවන විට
ඒ මුදල් කෙළින්ම ශ්‍රී ලංකාවට යැවෙන බැවින් එය
උපන් දේශයට සේවාවක්ද වන බව අමතක නොකරන්න

මහජන බැංකුව හැටන් නැෂනල් බැංකුව සෙලාන් බැංකුව සම්පත් බැංකුව හා කොමර්ෂල් බැංකුවේ ගිණුම් වලට
කෙළින්ම මුදල් බැර කර අපි ඔබේ කාලය හා මුදල් ඉතිරි කර දෙන්නෙමු
එපමණක් ද නොවේ. මේ බැංකු වල අනේවාසික ගිණුම් වලට
කප්රුක හරහා මුදල් තැන්පත් කරන විට
ඔබට එම බැංකු වලට ගාස්තුවක් ගෙවන්නට ද සිදු නොවෙයි....

අදම අමතන්න
ඔබේ අවශ්‍යතා මැනැවින් හඳුනාගෙන ඔබ අමතන්නට
මනා වැටහීමක් ඇති ශ්‍රී ලාංකික හිතවතකු සැමවිට ම
කප්රුක ආයතනයේ සිටියි

වසර 8 ක සේවය

කප්රුක යනු 100% ක් නීත්‍යානුකූලව ශ්‍රී ලංකාවට මුදල් යැවිය හැකි ආයතනයකි
අපි ශ්‍රී ලංකා මහ බැංකවේ සහ AUSTRAC නීති රීති අකුරටම පිළිපැද
ඔබේ මුදලට නිසි ආරක්ෂාව ලබා දෙන්නෙමු

ඩොලර් 1000 දක්වා අයකිරීම ඩොලර් 10 ක් පමණකි

Jagath - Sannasa

Kapruka Pty Ltd
Unit 1, 1324 Centre Road
Clayton Sth, Vic 3169
Phone: (03) 9544 5060
Fax: (03) 9544 2010
Mobile: 0418 556407 or 0400 306434
Web : www.kapruka.biz
Email addresses: kapruka@techno.net.au,
kapruka@hotmail.com,
kapruka@bigpond.com,

Kapruka
Tree that gives wealth